# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් / නිල ඇඳුම් රෙදි ප්‍රසම්පාදනය

**ලංසු අංකය : PR/02/11-02 (2027)**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් / නිල ඇඳුම් රෙදි ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

අවශ්‍යතාවන් පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

| | අයිතම විස්තරය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 1 | කලිසම් රෙදි (පිරිමි නිලධාරීන් සඳහා) | මීටර 1995 |
| 2 | කමිස - අත් දිග (පිරිමි නිලධාරීන් සඳහා) | 1596 |
| 3 | කමිස - අත් කොට (පිරිමි නිලධාරීන් සඳහා) | 798 |
| 4 | හැට්ට රෙදි සමග සාරිය (කාන්තා නිලධාරීන් සඳහා) | 3054 |

1. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234, 2 වන මහල, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) ප්‍රසම්පාදන කළමනාකරු වෙතින් 2026.08.03 සිට 2026.08.24 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතර තුර කාලයේදී දුරකථන අංක 011-2887585, ඊමේල් : mgr_procurement@slbfe.lk මගින් ලබාගත හැක.

2. ඉහත ලිපිනයේ ප්‍රසම්පාදන අංශයේදී 2026.08.03 සිට 2026.08.24 දක්වා වැඩකරන දිනයන්හිදී කාර්යාල වේලාව තුළ අභිලාෂී ලංසුකරුවන්ට ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

3. නැවත නොගෙවන ගාස්තුව ශ්‍රී ලංකා රුපියල් විසිදහසක් (රු. 20,000.00) ගෙවීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) සභාපති වෙත සමාගම් ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

4. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ (BRC) මුල් පිටපත, සහතික කරන ලද අනු පිටපතක් සහිතව, ලංසු ලිපි ලේඛන මිලදී ගැනීමේදී ඉල්ලීම් ලිපියට අමුණා එවිය යුතුය. BRC මුල් පිටපත සත්‍යාපනය කරගැනීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

5. මෙම ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු / ලංසුකරුවන් ලංසු ලේඛනයන්හි දක්වා ඇති අවම සුදුසුකම් අවශ්‍යතා සපුරාලිය යුතුය.

6. ලංසු බහාලන ලද මුද්‍ර, තැබූ කවරයෙහි ඉහළ වම් කෙළවරේ **"SLBFE කාර්යය මණ්ඩලය සඳහා නිල ඇඳුම්/ නිල ඇඳුම් රෙදි සැපයීම"** PR/02/11-02 (2027) යනුවෙන් සඳහන් කොට, දෙවන මහලෙහි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි (අංක 01) තැන්පත් කළ යුතුය. 2026.08.25 දින පෙ.ව. 11.00ට ටෙන්ඩර් පෙට්ටිය වසා දමනු ලබන අතර. ඒ හා වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවිය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගැනේ.

7. සියලුම ලංසු සමග සම්පූර්ණ ලංසු වටිනාකමින් 1%ක වටිනාකමින් යුත් **"ලංසු සුරක්ෂණයක්"** අමුණා එවිය යුතුය. ලංසු භාරගන්නා අවසන් දිනයේ සිට දින 119ක් සඳහා (2026.08.25 සිට 2026.12.23 දක්වා) ලංසු සුරක්ෂණය වලංගු විය යුතු අතර, එය ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

8. පූර්ව ලංසු රැස්වීමක් 2026.08.13 දින පෙ.ව. 11.00ට විදේශසේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) දෙවන මහලේ පිහිටි කුඩා රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම ලංසුවක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතු වේ. ලංසු සැකසීමේදී හෝ ඉදිරිපත් කිරීමේදී ලංසුකරුවන්ට දැරීමට සිදුවන කිසිදු වියදමක් සම්බන්ධයෙන් කමිටුව වගකීමක් නොදරයි.

**සභාපති**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත,**
**බත්තරමුල්ල.**
**දුරකථන / ෆැක්ස් : 011-2880550 / 2880564 / 2887585**
**Email : mgr_procurement@slbfe.lk**

**"එතෙර සවියට මෙතෙර අත්වැල"**